ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනපති උපාධි වැඩසටහන -2023/2024
අවසාන පරීක්ෂණය
**STP9813 - අධ්‍යාපන පර්යේෂණ ක්‍රම**
කාලය - පැය තුන (03) යි. විභාග අංකය :

---

දිනය : 2024.08.20 වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

විභාගය සඳහා උපදෙස්

01. පළමු ප්‍රශ්නය සහ වෙනත් ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.
02. පළමු ප්‍රශ්නයට මෙම ප්‍රශ්න පත්‍රයේම දී ඇති ඉඩ උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න.
03. එක් පර්යේෂණ ගැටලුවක් භාවිත කළ හැක්කේ එක් ප්‍රශ්නයක් සඳහා පමණක් බව සලකන්න.

01. අධ්‍යාපන අමාත්‍යාංශය පර්යේෂකයන්ගෙන්/ අධ්‍යාපනඥයින්ගෙන් පහත සඳහන් මාතෘකා යටතේ පර්යේෂණ යෝජනා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා ඇතැයි උපකල්පනය කරන්න.

(අ.) ගුරුවරුන්ගේ ඩිජිටල් සාක්ෂරතාව හා ඩිජිටල් නිපුණතා

(ආ.) ක්‍රීඩා ක්‍රම (gamification) භාවිතය මගින් සිසුන්ගේ විවේචනාත්මක චින්තන කුසලතා වැඩි දියුණු කිරීම.

(ඇ.) ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමේ/ ගණිතය ඉගෙනීමේ ප්‍රතිඵල වැඩි දියුණු කිරීම ඉලක්ක කරගත් ආරම්භක ක්‍රියාකාරකම් ඇගයීම.

(ඈ.) සිසුන් භාවිත කරන ඩිජිටල් තිරකාලය හා ඔවුන්ගේ අධ්‍යාපන ජයග්‍රහණ.

(ඉ.) සුතථ්‍ය (Authentic) තක්සේරු ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරුන් තුළ ඇති සූදානම.

තෝරාගත් තේමාව සඳහන් කරන්න..........................................................................

(i.) ලබාදී ඇති එක් තේමාවකට අදාළව ඔබ විසින් හඳුනා ගන්නා ලද විශේෂිත පර්යේෂණ ගැටලුවක් සඳහන් කරන්න. (ලකුණු 05)

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

(ii.) ඔබ තෝරාගත් ගැටලුව අධ්‍යයනය කිරීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

.....................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(iii.) එම ගැටලුව අධ්‍යයනය කිරීමේ ප්‍රධාන පරමාර්ථය සඳහන් කර, ඔබේ පර්යේෂණ ගැටලුවට අදාළව සුවිශේෂී පර්යේෂණ අරමුණු තුනක් (03) ක් හෝ පර්යේෂණ ප්‍රශ්න තුනක් (03) හෝ උපකල්පන තුනක් (03) සකස් කරන්න. (ලකුණු 09)

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(iv.) ඉහත ඔබ විසින් සකස් කරන ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තෝරා ගත හැකි පර්යේෂණ පරිසැලසුම සාධාරණීකරණය සහිතව පැහැදිලි කරන්න. අවම වශයෙන් හේතු දෙකක් **(02)** ක් වත් ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(v.) ඔබ තෝරා ගැනීමට අපේක්ෂිත නියැදිය හා නියදිකරණ ශිල්පීයක්‍රම සාධාරණීකරණය සහිතව සඳහන් කරන්න. (ලකුණු 05)

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(vi.) මෙම පර්යේෂණ ගැටලුව අධ්‍යයනය සඳහා ඔබ යෝජනා කරන දත්ත රැස් කිරීමේ උපකරණ සඳහන් කරන්න. ඔබේ පර්යේෂණ අධ්‍යයනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඒවායේ යෝග්‍යතාව සාධාරණීකරණය කරන්න.
(ලකුණු 06)

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

(vii.) අධ්‍යයනයේදී ඔබ විසින් රැස් කරගත් දත්ත විශ්ලේෂණය සඳහා ඔබ විසින් අනුගමනය කිරීමට අපේක්ෂිත විශ්ලේෂණ ශිල්පීය ක්‍රම සඳහන් කරන්න.
(ලකුණු 03)

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

(viii.) ඔබේ පර්යේෂණ අධ්‍යයනයේ අපේක්ෂිත සීමාවන් දෙකක් (02) සහ සීමා කිරීම් දෙකක් (02) සඳහන් කරන්න. (ලකුණු 04)

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

(මුළු ලකුණු 40)

02. සාහිත්‍ය විමර්ශනය ඕනෑම පර්යේෂණයක, විශේෂයෙන් අධ්‍යාපනික පර්යේෂණවල තීරණාත්මක අංගයකි.

(i.) පර්යේෂණ සංදර්භය තුළ සාහිත්‍ය විමර්ශනයක වැදගත්කම සාකච්ඡා කර, එය පර්යේෂණ ප්‍රශ්න හෝ අරමුණු සැකසීමට දායක වන ආකාරය උදාහරණ සමගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) සාහිත්‍ය විමර්ශනයක් සඳහා මූලාශ්‍ර තෝරා ගැනීමේදී සැලකිය යුතු මූලික නිර්ණායක පහ (05) පැහැදිලි කරන්න. එක් එක් නිර්ණායක පැහැදිලි කිරීම සඳහා උදාහරණ සපයන්න. (ලකුණු 06)

(iii.) සාහිත්‍ය විමර්ශනයකදී විවිධ මූලාශ්‍රවලින් ලබා ගන්නා තොරතුරු සංස්ලේෂණය කරන්නේ කෙසේද යන්න විස්තර කරන්න. මෙම ක්‍රියාවලියේදී තේමා පදනම් කරගත් විශ්ලේෂණයේ කාර්ය භාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv.) සාහිත්‍ය විමර්ශනයක් කිරීමේදී පර්යේෂකයකු මුහුණ දෙන අභියෝග මොනවාදැයි දක්වා, එම අභියෝග ජය ගැනීමට ගත හැකි උපාය මාර්ග යෝජනා කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

03. නියැදිකරණය යනු සමස්ත ජනගහනය නියෝජනය කිරීම සඳහා විශාල ජනගහනයකින් පුද්ගලයන්, අයිතම හෝ නිරීක්ෂණ උපකුලකයක් තෝරා ගැනීමේ ක්‍රියාවලියයි.

(i.) පර්යේෂණ ක්‍රියාවලියේදී නියැදිකරණයේ වැදගත්කම සාකච්ඡා කර, එය පර්යේෂණයේ වලංගුතාවයට හා විශ්වසනීයතාවට දායක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) පර්යේෂණවලදී යොදා ගන්නා සම්භාවිතා නියැදිකරණ ක්‍රම ශිල්ප දෙකක් (02) හා අසම්භාවිතා නියැදිකරණ ක්‍රම ශිල්ප දෙකක් (02) සසඳා බලන්න. එක් එක් ක්‍රම ශිල්පය සඳහා උදාහරණ සපයන්න. (ලකුණු 08)

(iii.) පර්යේෂණ අධ්‍යයනයක් සඳහා ජනගහනය නියෝජනය වන ආකාරයට නියෝජිත නියැදි ප්‍රමාණය තීරණය කිරීමට සම්බන්ධ පියවර විස්තර කරන්න. නියැදි දෝෂ ආන්තිකය සහ විශ්වාස මට්ටම සඳහා සලකා බැලීම් ඇතුළත් කරන්න. (ලකුණු 07)

(මුළු ලකුණු 20)

04. අධ්‍යාපනික පර්යේෂණවල දත්ත රැස් කිරීම යනු පර්යේෂණ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම, උපකල්පන පරීක්ෂා කිරීම සහ ප්‍රතිඵල ඇගයීම සඳහා තොරතුරු සහ සාක්ෂි එක්රැස් කිරීමේ ක්‍රමානුකූල ක්‍රියාවලියයි.

(i.) සුදුසු උදාහරණ භාවිත කරමින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත රැස් කිරීමේ උපකරණවල ලක්ෂණ වෙන් වෙන්ව හඳුනා ගන්න. (ලකුණු 06)

(ii.) එක් එක් ප්‍රධාන පියවර හා එම පියවරවල සලකා බැලීම් ඇතුළත් වන සේ වලංගු හා විශ්වසනීයදායක සමීක්ෂණ ප්‍රශ්නාවලියක් සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය විස්තර කරන්න. (ලකුණු 06)

(iii.) පර්යේෂණයක පිරිසැලසුමක් හා පර්යේෂණ අරමුණු සුදුසු දත්ත රැස් කිරීමේ උපකරණ තෝරා ගැනීමට දායක වන ආකාරය පැහැදිලි කරන්න. ඔබේ පැහැදිලි කිරීම් සඳහා උදාහරණ සපයන්න. (ලකුණු 08)

(මුළු ලකුණු 20)

05. (i.) පර්යේෂණ යෝජනාව හා පර්යේෂණ වාර්තාව යන ලේඛන නිර්වචනය කර, අධ්‍යාපනික පර්යේෂණ සංදර්භය තුළ ඒවායේ අරමුණු පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) පර්යේෂණ යෝජනාවක සහ පර්යේෂණ වාර්තාවක අවම වශයෙන් තිබිය යුතු කොටස් පහක් ලැයිස්තුගත කර සංසන්දනය කරන්න. එම සංරචක වෙන් වෙන්ව හඳුනා ගැනීමට උදාහරණ සපයන්න. (ලකුණු 06)

(iii.) පර්යේෂණ යෝජනාවක් සකස් කිරීමේදී පැන නගින ආචාර ධර්ම ගැටලු තුනක් හඳුනා ගෙන සාකච්ඡා කරන්න. එක් එක් ගැටලු ජය ගැනීම සඳහා අවම වශයෙන් උපාය මාර්ග දෙකක්වත් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(මුළු ලකුණු 20)

-හිමිකම් ඇවිරිණි. -